# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.12.22 |



## ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය - 2020

### ජාතික සෞභාග්‍යය

| | 2019 | 2020 |
|---|---|---|
| ***ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය*** | ***0.783*** | ***0.786*** |
| ***උපදර්ශක*** | | |
| ***ආර්ථික සහ ව්‍යාපාර පරිසරය*** | *0.871* | *0.846* |
| ***ජන ජීවිතයේ යහපැවැත්ම*** | *0.731* | *0.795* |
| ***සමාජ-ආර්ථික යටිතල පහසුකම්*** | *0.748* | *0.718* |

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය[1], 2019 වසරේ වාර්තා කළ 0.783 සිට 2020 වසරේ දී 0.786 දක්වා සුළු වශයෙන් ඉහළ යන ලදී. කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ වුවද, 'ජන ජීවිතයේ යහපැවැත්ම' උපදර්ශකයෙහි වැඩිදියුණු වීමක් පෙන්නුම් කළ අතර, 'ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය' සහ 'සමාජ-ආර්ථික යටිතල පහසුකම්' යන උපදර්ශකවල පසුබෑමක් දක්නට ලැබුණි.

**රූප සටහන 1 - ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකයෙහි සහ එහි උපදර්ශකවල විචලනයන්: 2016 – 2020**




**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සහ රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව ඉහළ නැංවීම මඟින් නිරූපණය කෙරෙන උසස් අධ්‍යාපනය සඳහා වැඩි අවස්ථා සැලසීම, ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකයෙහි ඉහළ යෑමට දායක වී ඇත. මීට අමතරව, වසංගත සමයේ සිදු වූ කාර්මික ක්‍රියාකාරකම්වල පහළ යෑම, වාහන වායු විමෝචනය අඩු වීම සහ මහජනයාගේ සංචරණ සීමා කිරීම යනාදියෙහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ වාතයේ ගුණාත්මකභාවය සහ පරිසරයේ පිරිසිදුකම වැඩි දියුණු වීම ද, මෙම උපදර්ශකයේ ඉහළ යෑම සඳහා හේතු වූ ප්‍රධාන නිර්ණායක ලෙස හඳුනාගෙන ඇත.

කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම් සමඟ, විධිමත් හා අවිධිමත් රැකියා කාණ්ඩ දෙකෙහිම විරැකියාව ඉහළ යාමත්, ආර්ථික ක්‍රියාකාරකම්වල දුර්වල කාර්යසාධනය හේතුවෙන් ඇති වූ දළ දේශීය නිෂ්පාදිතයේ අඩුවීමත් 2020 වර්ෂය තුළ ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකයේ පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය.

වසංගතය හේතුවෙන් වසර තුළ දී පනවන ලද අගුලු දැමීම් සහ සංචරණ සීමා කිරීම් සමඟ ප්‍රවාහන කටයුතු අඩු වීම සහ සෞඛ්‍ය අවදානම් හේතුවෙන් පොදු ප්‍රවාහනය භාවිතය සැලකිය යුතු ලෙස අඩුවීම සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකයේ පහළ යෑමට ප්‍රධාන සාධක විය.

**රූප සටහන 2 – සෞභාග්‍යතා දර්ශකය මඟින් ආවරණය වන අංශ**





[1] ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය යනු රටෙහි සෞභාග්‍යය මැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරනු ලබන බහුමාන දර්ශකයකි. මෙම දර්ශකය, සෞභාග්‍යය මනිනු ලබන විවිධ අංශ නියෝජනය කරන විචල්‍යයන් 41 ක් යොදා ගනිමින් ගණනය කරනු ලබන ආර්ථික සහ ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ-ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුනකින් සමන්විත වේ. ආර්ථික සහ සමාජීය යහපැවැත්ම තක්සේරු කිරීමේ ගෝලීය දර්ශකයක් වන Legatum සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීමේ දී භාවිතා කරන ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් අනුගමනය කරමින් ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීමේ ක්‍රමවේදය, 2020 වසර සඳහා වන දර්ශකය සම්පාදනයේ සිට සංශෝධනය කරන ලදී.

## පළාත්බද සෞභාගයය

පළාත්බද සෞභාගයතා දර්ශකයෙහි ඉහළම අගය වාර්තා කරමින්, බස්නාහිර පළාත ප්‍රමුඛස්ථානයෙහි රැඳී සිටින අතර දකුණු සහ මධ්‍යම පළාත්වලට පිළිවෙළින් දෙවන සහ තෙවන ස්ථාන හිමි විය. පෙර වසර හා සැසඳීමේ දී, සෞභාගයතා දර්ශකයෙහි වැඩිම වර්ධනය නැගෙනහිර පළාතෙන් වාර්තා වූ අතර, ඉන් පසු දකුණු, උතුරුමැද, වයඹ, ඌව, බස්නාහිර සහ උතුරු යන පළාත් අනුපිළිවෙළින් වර්ධනයන් වාර්තා කරන ලදී. මේ අතර, පළාත්බද සෞභාගයතා දර්ශකයේ පසුබෑම් වාර්තා වී ඇත්තේ සබරගමුව සහ මධ්‍යම පළාත් වලිනි.

**රූප සටහන 3 - පළාත්බද සෞභාගයතා දර්ශකය: 2019- 2020**




**සංඛ්‍යා සටහන 1 - පළාත්බද සෞභාගයතා දර්ශක සහ පළාත්බද ශ්‍රේණි**

| | දර්ශක අගය | | පළාත්බද ශ්‍රේණිය | |
|---|---|---|---|---|
| | 2019 | 2020 | 2019 | 2020 |
| මධ්‍යම | 0.567 | 0.564 | 3 | 3 |
| නැගෙනහිර | 0.498 | 0.516 | 8 | 8 |
| උතුරු මැද | 0.522 | 0.531 | 7 | 6 |
| වයඹ | 0.549 | 0.556 | 4 | 4 |
| උතුරු | 0.540 | 0.541 | 5 | 5 |
| සබරගමුව | 0.530 | 0.525 | 6 | 7 |
| දකුණු | 0.569 | 0.584 | 2 | 2 |
| ඌව | 0.484 | 0.489 | 9 | 9 |
| බස්නාහිර | 0.815 | 0.819 | 1 | 1 |

**මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව**

## පළාත්බද සෞභාගයතා උපදර්ශකයන්හි කාර්ය සාධනය

### ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය

රැකියා අවස්ථා ඉහළ යෑම සහ අවිධිමත් අංශයේ වැටුප් වැඩිවීම ප්‍රධාන කොටගෙන මෙම උපදර්ශකයේ වැඩිම ඉහළ යෑම නැගෙනහිර පළාතෙන් වාර්තා විය. මීට අමතරව, මූලික වශයෙන් අවිධිමත් අංශයේ වැටුප් වැඩිවීම සහ සාපේක්ෂව ස්ථාවර මිල මට්ටම් පැවතීම හේතුවෙන් උතුරු සහ මධ්‍යම පළාත්වල ද මෙම උපදර්ශකයේ ඉහළ යෑමක් සිදු විය. අනෙකුත් පළාත්වල මෙම උපදර්ශකයේ පහළ යෑමට විරැකියාව ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, වසර තුළ පැවති සාපේක්ෂ වශයෙන් විචලනශීලී මෙන්ම ඉහළ මිල මට්ටම් ඌව, වයඹ සහ උතුරු මැද පළාත් තුළ මෙම උපදර්ශකය දුර්වල කාර්යසාධනයන් පෙන්නුම් කිරීම සඳහා හේතු වී ඇත.

### ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය

සෞඛ්‍ය පහසුකම් වල සිදු කරන ලද වැඩි දියුණු කිරීම්, වසංගත තත්ත්වය යටතේ ක්‍රියාත්මක කරන ලද පූර්වාරක්ෂක ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන් වාතයේ ගුණාත්මකභාවය සහ පරිසරයේ පිරිසිදුභාවය වැඩිදියුණු වීම, මෙන්ම 2020 වසර තුළ විශ්ව විද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීමේ සැලකිය යුතු වැඩි වීමත් සමඟ උසස් අධ්‍යාපනය සඳහා අවස්ථා වැඩි කිරීම හේතුවෙන් සියලුම පළාත්වල මෙම උපදර්ශකයේ ඉහළ යෑමක් වාර්තා විය. උපදර්ශකයේ ඉහළම වර්ධනය උතුරු පළාතෙන් වාර්තා වූ අතර පහළම වර්ධනය මධ්‍යම පළාතෙන් වාර්තා විය.

### සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය

සියලුම පළාත්වල මෙම උපදර්ශකයේ පහළ යෑමක් වාර්තා වී ඇති අතර වසංගත සමයේ පොදු ප්‍රවාහන පහසුකම් භාවිතය සැලකිය යුතු ලෙස අඩුවීම මෙයට ප්‍රධාන හේතුව විය. උපදර්ශකයේ වැඩිම පහළ යෑම උතුරු පළාතෙන් වාර්තා වූ අතර සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය සපයා ගැනීමේ හැකියාව අඩු වීම ද මෙම දුර්වල කාර්යසාධනයට ප්‍රධාන හේතුවක් වී ඇත. මේ අතර, උපදර්ශකයේ අඩුම පහළ යෑම වයඹ පළාතෙන් නිරීක්ෂණය විය.

**සංඛ්‍යා සටහන 2 - පළාත්බද සෞභාගයතා උපදර්ශක [2]**

| | 2019 | 2020 |
|---|---|---|
| *ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය* | | |
| මධ්‍යම | 0.598 | 0.603 |
| නැගෙනහිර | 0.554 | 0.586 |
| උතුරු මැද | 0.608 | 0.605 |
| වයඹ | 0.605 | 0.595 |
| උතුරු | 0.614 | 0.623 |
| සබරගමුව | 0.553 | 0.547 |
| දකුණු | 0.573 | 0.572 |
| ඌව | 0.554 | 0.540 |
| බස්නාහිර | 0.900 | 0.889 |
| *ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය* | | |
| මධ්‍යම | 0.502 | 0.532 |
| නැගෙනහිර | 0.454 | 0.493 |
| උතුරු මැද | 0.506 | 0.562 |
| වයඹ | 0.530 | 0.567 |
| උතුරු | 0.499 | 0.570 |
| සබරගමුව | 0.520 | 0.555 |
| දකුණු | 0.553 | 0.612 |
| ඌව | 0.437 | 0.489 |
| බස්නාහිර | 0.710 | 0.749 |
| *සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය* | | |
| මධ්‍යම | 0.600 | 0.557 |
| නැගෙනහිර | 0.486 | 0.468 |
| උතුරු මැද | 0.450 | 0.426 |
| වයඹ | 0.513 | 0.507 |
| උතුරු | 0.506 | 0.431 |
| සබරගමුව | 0.516 | 0.472 |
| දකුණු | 0.581 | 0.568 |
| ඌව | 0.463 | 0.437 |
| බස්නාහිර | 0.835 | 0.820 |

[2] දර්ශක අගයන් සම්පාදනය කරනු ලබන්නේ පසුගිය වසර 14 තුළ වාර්තා වූ එහි ඉහළම සහ පහළම අගයන්ට අනුරූපව සෑම විචල්‍යයක්ම සාමාන්‍යකරණය කිරීමෙනි. සාමාන්‍යකරණය කළ විචල්‍යයකින් ගත හැකි ඉහළම සහ පහළම අගයන් පිළිවෙලින් 1 සහ 0 වේ. එමගින්, දර්ශක අගයන් ද 0 සහ 1 අතර පරාසයක විචලනය වේ. මෙමගින්, දර්ශකයෙහි අගය වැඩි වීමත් සමඟම, කාලයත් සමඟ සහ පළාත් එකිනෙක අතර එහි කාර්ය සාධනයන් සන්සන්දනය කිරීමේ හැකියාවද සාපේක්ෂව වැඩි වේ.

## තාක්ෂණික සටහන:

**සෞභාග්‍යතා දර්ශකය**

උපදර්ශක 3 ක් යටතේ වර්ගීකරණය කරන ලද විචල්‍යයන් 41 ක් යොදා ගනිමින් සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කරනු ලබන අතර ප්‍රධාන දර්ශකය තුළ සියලුම උපදර්ශක සඳහා සමාන බර තැබීම් ලබා දී තිබේ.

ආර්ථික සහ ව්‍යාපාරික පරිසරය උපදර්ශකය මිල ස්ථායීතාව, ජීවන තත්ත්වය, ආදායම, දරිද්‍රතාවය, සේවා නියුක්තිය, කර්මාන්තශාලා ඝනත්වය සහ බැංකු ශාඛා ඝනත්වය ලෙස වර්ග කරනු ලැබූ විචල්‍යයන් 9 ක් භාවිතා කරමින් සම්පාදනය කරනු ලැබේ. ජන ජීවිතයේ යහපැවැත්ම පිළිබඳ උපදර්ශකය ගණනය කිරීමේ දී, සෞඛ්‍ය පහසුකම් පැවතීම, අධ්‍යාපන පහසුකම් පැවතීම හා එහි ගුණාත්මකභාවය, වත්කම්, විනෝද කටයුතු සඳහා වූ පහසුකම් පැවතීම හා එහි භාවිතය, වායුගෝලයේ ගුණාත්මකභාවය සහ පරිසරයේ පිරිසිදු බව යන අංශයන්ට අදාළව විචල්‍යයන් 22 ක් භාවිතා කරනු ලැබේ. සමාජ-ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය විචල්‍යයන් 10 කින් සමන්විත වන අතර, එමගින් ප්‍රවාහන පහසුකම් පැවතීම, මහා මාර්ග පහසුකම් පැවතීම, විදුලි සංදේශ පහසුකම් පැවතීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් පැවතීම, විදුලිබල පහසුකම් පැවතීම, ආරක්ෂිත පානීය ජල පහසුකම් පැවතීම හා එහි ගුණාත්මකභාවය, සහ සනීපාරක්ෂක පහසුකම් පැවතීම සහ අපරාධවලින් තොර පරිසරයක් පැවතීම, යන පැතිකඩ ආවරණය වේ.

**ක්‍රමවේදය**

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනයේ දී යොදා ගන්නා විචල්‍යයන් විවිධ මිනුම් ඒකක මගින් ගණනය කරනු ලබයි. එම නිසා සියලුම විචල්‍යයන්ගේ පසුගිය වසර 14 ක දත්ත, සාමාන්‍යකරණය මගින් පොදු පරිමාණයකට සකසා ගනු ලැබේ. සමස්ත රටෙහි හා පළාත්වල දර්ශක වෙන් වෙන් වශයෙන් සම්පාදනය කර ඇති බැවින් පළාත්බද දර්ශක, ජාතික මට්ටමේ දර්ශක සමඟ සංසන්දනය කළ නොහැක. ඒ අනුව, පළාත්බද දර්ශක, පළාත් එකිනෙක අතර හා කාලය සමඟ සංසන්දනය කළ හැකි අතර ජාතික මට්ටමේ දර්ශක කාලය සමඟ පමණක් සංසන්දනය කළ හැක.

ආර්ථික සහ සමාජීය යහපැවැත්ම තක්සේරු කිරීමේ ගෝලීය දර්ශකයක් වන Legatum සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීමේ දී භාවිතා කරන ක්‍රමවේදයට සමාන ක්‍රමවේදයක් අනුගමනය කරමින් ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කිරීමේ ක්‍රමවේදය, 2020 වසර සඳහා වන දර්ශකය සම්පාදනයේ සිට සංශෝධනය කරන ලදී. පසුගිය වසර 10 ට අදාළව එක් එක් විචල්‍යයන් සම්මතකරණය කිරීම වෙනුවට, විචල්‍යයන් සාමාන්‍යකරණය කිරීම මගින් පසුගිය වසර 14 තුළ වාර්තා වූ ඉහළම සහ පහළම අගයන් වලට අනුරූපව සෑම විචල්‍යකම හැසිරීම නිරීක්ෂණය වන අයුරින් (distance to frontier approach) මෙම සංශෝධනය සිදු කරන ලදී. එමගින්, දර්ශක පරාසය 0 සහ 1 අතර පවතින බැවින් දර්ශකය අර්ථකථනය කිරීම පහසු වන අතර, දර්ශකයේ ඉහළ අගයන් මඟින් සෞභාග්‍යතාවයේ වැඩි දියුණු වීම ද පහළ අගයන් මඟින් සෞභාග්‍යතාවයේ පසුබෑම ද නිරූපණය වේ.